**බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 31 - 2022**

**------------------------------------------------------------------**

**1. විගණන මතය**

1.1 බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 31 ක 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන, මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් සහ සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 31 ක මූල්‍ය ප්‍රකාශන පිළිබඳව තත්ත්වාගණනය කල මතය ප්‍රකාශ කිරීමට හේතු වී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 25 ක් විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 42 ඡේදය ප්‍රකාරව ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනයකල යුතුය. |
| (ආ) | ගොවි බැංකුව, ගොවිජන සේවා කාරක සභාවේ ඒකකයක් වුවද බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 31 හි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | ප්‍රධාන කාර්යාලයෙන් උපදෙස් ලබාගෙන ඉදිරියේදී කටයුතු කරන බව. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කල යුතුය. |

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 13 ක් සතු ගොඩනැගිලි 18 කද, ඉඩම් 10 කද, වෙනත් වත්කම් 04 කද වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව | කාරක සභා සතු වත්කම්වල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කාරක සභා 23 ක වසර 4 සිට වසර 34 දක්වා කාල පරාසයක සිට අයවිය යුතු ශේෂයන් ලෙස ඉදිරියට ගෙන එමින් තිබුණු එකතුව රු.29,580,002 ක් වූ ගිණුම් ශේෂයන් 331 ක් අයකර ගැනීමට හෝ සුදුසු පරිදි කටයුතු කිරීම වෙනුවට ණයගැතියන් ලෙස දක්වා තිබීමෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල එම වටිනාකමට ව්‍යාජ වත්කම් දක්වා තිබුණි. | පරීක්ෂා කර බලා අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ එසේ නොහැකි නම් අනුමැතියක් ලබාගෙන කපා හැරීමට කටයුතු කරන බව. | අයවිය යුතු බව තහවුරු කර ගත නොහැකි ශේෂයන් සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් යටතේ සුදුසු පරිදි කටයුතු කල යුතු අතර අය කර ගත හැකි ශේෂයන් හඳුනාගෙන අයකර ගත යුතුය. |
| (ඇ) | කාරක සභා 21 ක වසර 2 සිට වසර 40 දක්වා කාල පරාසයක සිට ගෙවිය යුතු ශේෂයන් ලෙස ඉදිරියට ගෙන එමින් තිබුණු එකතුව රු.29,803,433 ක් වූ ගිණුම් ශේෂයන් 308 ක් විධිමත් අනුමැතියක් ලබාගෙන සුදුසු පරිදි කටයුතු කිරීම වෙනුවට ණයහිමියන් ලෙස දක්වා තිබීමෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල එම වටිනාකමට ව්‍යාජ වගකීම් දක්වා තිබුණි. | පරීක්ෂා කර ලබා අදාල පාර්ශවයන් හඳුනා ගෙන ගෙවීම් කිරීමට හෝ එසේ නොහැකි නම් අනුමැතියක් ලබා ගෙන ශේෂයන් කපා හැරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු බව තහවුරු කර ගත නොහැකි ශේෂයන් සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් යටතේ සුදුසු පරිදි කටයුතු කල යුතු අතර ගෙවිය යුතු ශේෂයන් හඳුනාගෙන කඩිනමින් ගෙවීම් කල යුතුය. |
| (ඈ) | කාරක සභා 02 ක වටිනාකම රු.499,361 ක්වූ භෞතිකව නොපවතින ට්‍රැක්ටර් රථ 02 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිරවුල් කරන බව | සුදුසු පරිදි මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | රඹුක්පොත ගොවිජන සේවා කාරක සභාව විසින් සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගෙන තිබුණු රු.1,118,781 ක් වටිනා කාර්යාල උපකරණ සඳහා සහ රු.2,731,028 ක් වූ ගොඩනැගිලි වැඩිදියුණු කිරීම් සඳහා සමාලෝචිත වර්ෂයට අදාල රු.248,429 ක ක්ෂය ගිණුම් ගත කර නොතිබුණු අතර, ලුණුගල ගොවිජන කාරක සභාව විසින් ස්ථාවර වත්කම් ක්ෂය රු.322,185 ක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ වියදම් යටතේ දක්වා නොතිබීමෙන් වර්ෂයේ අතිරික්තය රු.570,614 කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | වර්ෂයට අදාල ස්ථාවර වත්කම් සඳහා වූ ක්ෂය වටිනාකම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ වියදම් යටතේ ගිණුම්ගත කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ඌවපරණගම ගොවිජන සේවා කාරක සභාව විසින් ඉදිරිපත් කල ශේෂ පිරික්සුමේ හර ශේෂයන්ගේ නිවැරදි එකතුව රු.4,478,064 ක් හා බැර ශේෂයන්ගේ නිවැරදි එකතුව රු.4,428,360 ක් විය යුතු වුවද එම අගයන් රු.4,424,461 ක් ලෙස දක්වා ශේෂ පිරික්සුම දෝෂ සහිතව තුලනය කර තිබුණු අතර, බඹරපාන ගොවිජන සේවා කාරක සභාවේ ශේෂ පිරික්සුමේ හර ශේෂයන්ගේ එකතුව රු.4,470,551 ක් හා බැර ශේෂයන්ගේ එකතුව රු.4,470,058 ක් වුවද එම අගයන් පිළිවෙලින් රු.4,470,561 ක් හා රු.4,470,511 ක් ලෙස දක්වා දෝෂ සහිතව තුලනය කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ශේෂ පිරික්සුමේ නිවැරදි ශේෂයන් ඇතුලත් කර තුලනය කල යුතුය. |
| (උ) | කාරක සභා 04 ක් විසින් සමාලෝචිත වර්ෂය තුල මිලදීගෙන තිබුණු එකතුව රු.345,807 ක් වටිනා ස්ථාවර වත්කම්, ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත නොකර අයභාර වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශන වලදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | නිවැරදි වර්ගීකරණයන් සහිතව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. |
| (ඌ) | ඌවපරණගම කාරක සභාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුළු වත්කම් ශේෂය රු.6,405,789 ක් විය යුතු වුවද එය රු.3,213,790 ක් ලෙස දෝෂ සහගතව එකතු කර තිබීමෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය රු.3,191,999 කින් තුලනය නොවන බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිවැරදි කරන බව | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන තුලනය කිරීමට කටයුතු කල යුතුය. |

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 08 කට අදාල ගිණුම් විෂයයන් 15 ක මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම, අනුරූපී වාර්තා අනුව වූ වටිනාකම සමඟ සැසඳීමේදී රු.6,610,793 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | සැසඳීම් කර නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

### 1.3.4 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 07 ක වර්ෂ 10 කට පෙර සිට ඉදිරියට ගෙන එන අවිනිශ්චිත ගිණුම් හර ශේෂය වූ රු.910,382 ක් සහ ගොවිජන සේවා කාරක සභා 04 ක වර්ෂ 10 කට පෙර සිට ඉදිරියට ගෙන එන අවිනිශ්චිත ගිණුම් බැර ශේෂය රු.1,241,623 ක් නිරවුල් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | අවිනිශ්චිත ගිණුම් ඇතිවීමට හේතු හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළයුතුය. |

### 1.3.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 22 කට අදාලව එකතුව රු.38,900,852 ක්වූ වත්කම් ශේෂ 173 ක් සහ ගොවිජන සේවා කාරක සභා 16 කට අදාලව එකතුව රු.108,373,673 ක්වූ වගකීම් ශේෂ 101 ක් උපලේඛන, ස්ථාවර වත්කම් ලේඛන, ණයගැති හා ණයහිමි ලේඛන සහ ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සියළු ශේෂයන් සනාථ කිරීම සඳහා අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කල යුතුය. |

### 1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත<br>-------------<br>55 (1) වගන්තිය | | ස්වකීය බල ප්‍රදේශය මේ වන විට ඉඩම් ගොවිජන සංවර්ධන ඇතුලත කෘෂිකාර්මික මැනීමට කටයුතු කරමින් පනතේ විධිවිධාන | | |

| | | | | |
|---|---|---|---|---|
| | | ඉඩම් මැනීමට කටයුතු සැලැස්විය යුතු වුවද කාරක සභා 22 ක් විසින් එසේ කටයුතු කර නොතිබුණි. | පවතින බව | අනුව කටයුතු කල යුතුය. |
| (ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය සහ මුදල් රෙගුලාසි 133 සහ 134 වගන්ති | | කාරක සභා 21 ක අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ප්‍රධාන කාර්යාලයෙන් උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු කරන බව. | පනතේ විධිවිධාන සහ මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>------------- | | | | |
| (i) මුදල් රෙගුලාසි 396 (ඇ) | 494,179 | කාරක සභා 08 ක් විසින් නිකුත් කර මාස 06 ඉක්මවූ ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොකල චෙක්පත් 23 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මුදල් රෙගුලාසි පරිදි කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 571 | 774,353 | බදුල්ල ගොවිජන සේවා දිස්ත්‍රික් කාර්යාලයට අදාලව තැන්පත් කර වසර 02 ඉක්මවූ ශේෂ 09 ක් සම්බන්ධයෙන් යොමුගත මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. | අක්මුදල් ලබාගෙන ඉදිරියේදී නිරවුල් කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) මුදල් රෙගුලාසි 880 හා ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2020 ජූනි 25 දිනැති අංක 8/2020 දරන චක්‍රලේඛය | | කාරක සභා 18 ක භාණ්ඩ, මුදල් භාරව කටයුතු කරන නිලධාරීන් 199 ක් විසින් ඇප තැන්පත් කර නොතිබුණි. | ඉදිරියේදී නියමිත පරිදි කටයුතු කරන බව | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය. |
| (ඇ) ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ<br>------------- | | | | |
| (i) 1986 ඔක්තෝබර් 21 දිනැති අංක 264 දරන චක්‍රලේඛයේ 1 ඡේදය | 2,983,513 | සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාලව ලැබිය යුතු කාමර කුලී අයකර ගෙන නොතිබුණි. | අදාල ආයතන දැනුවත් කර කුලී අය කරන බව | චක්‍රලේඛයේ විධිවිධාන පරිදි කටයුතු කර කාමරකුලී අයකරගත යුතුය. |
| (ii)2012 පෙබරවාරි 29 දිනැති අංක04/2012 දරන චක්‍රලේඛය 3.4.9 වගන්තිය | | සෑම මාසයක් තුළදීම ණය ලබා දුන් ගොවීන්ගේ නාම ලේඛනයක් ප්‍රධාන කාර්යාලයට පිටපත් සහිතව දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්ට ඊ ළඟ මස 15 දිනට පෙර යාවිය යුතු අතර, එහි පිටපත් ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ප්‍රදර්ශනය කළ යුතු වුවත්, එසේ සිදු කර නොතිබුණි. | ඉදිරියේදී නිසි පරිදි කටයුතු කරන බව | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) 2014 අගෝස්තු 22 දිනැති අංක 07/2014 (අංක 107 සංශෝධන) දරන චක්‍රලේඛය | දෛනිකව අත රඳවා ගත හැකි උපරිම මුදල රු.10,000 ක් වුවද කාරක සභා 11 ක් විසින් එම සීමාව ඉක්මවා අවස්ථා 486 කදී මුදල් අතරඳවාගෙන තිබුණි. | ඉදිරියේදී නිවැරදිව කටයුතු කරන බව | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |
| (iv) 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන චක්‍රලේඛය | කිසියම් වර්ෂයකට අදාල මූල්‍ය ප්‍රකාශන ඊලග වර්ෂයේ මාර්තු 31 දිනට පෙර විගණනයට ඉදිරිපත් කල යුතු වුවද කාරක සභා 15 ක් විසින් මාස 01 සිට 03 දක්වා ප්‍රමාදයකින් යුතුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කර තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව නියමිත කාලසීමාව තුල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 31 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ සමස්ථ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 6,624,036 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 15,342,794 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 8,718,758 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අලෙවි ආදායම් අඩුවීම, ජල හා විදුලි වියදම් හා උපකරණ අලුත්වැඩියා වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එක් ගොවිජන සේවා කාරක සභාවක සන කාබනික පොහොර කිලෝග්‍රෑම් 1,330 ක්ද, ගොවිජන සේවා කාරක සභා 07 ක කාබනික දියර පොහොර ලීටර් 5,531 ක්ද ගොවිජන සේවා කාරක සභා 01 ක ජෛව දියර පොහොර ලීටර් 959.5 ක්ද ගොවිජන සේවා කාරක සභා 03 ක රු.454,579 ක් වටිනා කෘෂි බීජ, කෘෂි රසායන සහ වෙනත් පොහොරද කල් ඉකුත් වී තිබුණු | පොහොර සම්බන්ධයෙන් පොහොර කමිටුවේ තීරණ අනුව කටයුතු කරන බව හා අනෙක් තොග සම්බන්ධව ඉදිරියේදී කටයුතු කරන බව. | අපහරණය කිරීමට හෝ සුදුසු පරිදි ඉවත් කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අතර ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |
| (ආ) | කාරක සභා 15 ක් විසින් එම කාරක සභාවලට අයත් ඉඩම්වල ප්‍රමාණයන් නිවැරදිව හඳුනාගෙන ඒවායේ නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් ඉල්ලීම් කර ඇති බව. | ගොවිජන සේවා කාරක සභාව සතු ඉඩම් වල නීත්‍යානුකූල අයිතිය කාරක සභා නමින් පවරා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | 2022 යල සහ 2022/23 මහ කන්නයේ වී වගාව සඳහා පරිසර හිතකාමී පොහොර ලබා දීමේ වැඩසටහන<br>----------------------------------------------------<br>බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 31 ක් අතුරින් තෝරාගත් ගොවිජන සේවා කාරක සභා 09 ක් යටතේ පොහොර බෙදා හැරීම පිළිබඳව පරීක්ෂා කිරීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ 2022/23 මහ කන්නය සඳහා පොහොර බෙදා හැරීම පිළිබඳව වූ මාර්ගෝපදේශයේ 5.5.1.4 වගන්තිය අනුව පරිසර හිතකාමී පොහොර සාම්පලවල විශ්ලේෂණ වාර්තා වැඩ කරන දින හතක් තුල විද්‍යාගාරවලින් ලබා ගැනීමටත්, නිෂ්පාදකයාගෙන් සාම්පල ලබාගෙන වැඩ කරන දින දහයක් තුල අනුකූලතා සහතිකය නිෂ්පාදකයාට නිකුත් කිරීමටත් කටයුතු කල යුතු වුවද කාරක සභා 09 ක් විසින් එසේ කටයුතු නොකල අවස්ථා නිරීක්ෂණය විය. | සම්බන්ධිත ආයතනවලින් තොරතුරු ලබාගෙන ඉදිරියේදී පිළිතුරු සපයන බව. | අදාල චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |
| (ii) | කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ 2022/23 මහ කන්නයට අදාලව කාබනික පොහොර බෙදා හැරීම පිළිබඳව වූ මාර්ගෝපදේශයේ 5.5.4.3.2 වගන්තිය අනුව පරිසර හිතකාමී පොහොර සඳහා වූ දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුව විසින් පොහොරවල ප්‍රමිතිය වඩාත් තහවුරු කර ගැනීම සඳහා විටින් විට බෙදා හරිනු ලබන පොහොර වල සාම්පල ජාතික පොහොර ලේකම් කාර්යාලය වෙත යොමු කල යුතු වුවත් විගණන පරීක්ෂාවට ලක් වූ ගොවිජන සේවා කාරක සභා 09 ක් විසින් පරිසර හිතකාමී පොහොර ලැබීමෙන් පසු කිසිදු තත්ත්ව පරීක්ෂාවකට ලක් කර නොතිබුණි. | සම්බන්ධිත ආයතනවලින් තොරතුරු ලබාගෙන ඉදිරියේදී පිළිතුරු සපයන බව. | අදාල මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ 2022/23 මහ කන්නයට අදාලව කාබනික පොහොර බෙදා හැරීම පිළිබඳව වූ මාර්ගෝපදේශයේ 5.5.4.3.6 වගන්තිය අනුව දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුව විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමග සම්බන්ධ වී යාය මට්ටමින් පාංශු පෝෂක පරීක්ෂා කිරීමට වැඩ සටහන් සංවිධානය කිරීම සහ එහි ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම, ඒ අනුව පොහොර භාවිතය පිළිබඳව උපදෙස් ගොවීන් වෙත ලබාදීම සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම කල යුතු වුවත් කාරක සභා 09 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | සම්බන්ධිත ආයතනවලින් තොරතුරු ලබාගෙන ඉදිරියේදී පිළිතුරු සපයන බව. | අදාල මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කල යුතුය. |
| (iv) | කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ 2022 යල කන්නය සඳහා පොහොර බෙදාහැරීම පිළිබඳව වූ මාර්ගෝපදේශයේ 7.5.4 වගන්තිය අනුව දෙපාර්තමේන්තුව විසින් සියලු දේශීය නිෂ්පාදකයින්ගේ පොහොර බතල ගොඩ, පරන්තන් හා බෝඹුවල ක්ෂේත්‍ර පරීක්ෂණයන් සඳහා යොමු කර එම පොහොර වල ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය පිළිබඳව නිර්දේශ ලබා දිය යුතු වුවත් කාරක සභා 09 කට අදාලව එසේ නිර්දේශ ලබා දීමක් සිදුකර නොතිබුණි. | සම්බන්ධිත ආයතනවලින් තොරතුරු ලබාගෙන ඉදිරියේදී පිළිතුරු සපයන බව. | අදාල මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කල යුතුය. |
| (ඇ) | 2022 යල කන්නයේ වී වගාව සඳහා යූරියා පොහොර නිකුත් කිරීමේ වැඩසටහන<br>--------------------------------------------------<br>බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 31 අතුරින් තෝරාගත් ගොවිජන සේවා කාරක සභා 07 ක් යටතේ පොහොර බෙදාහැරීමේ ක්‍රියාවලිය පරීක්ෂා කිරීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | වසම්භාර කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් තම වසමේ 2022 යල කන්නයේ වී වගා කරන ලද ගොවීන් ක්ෂේත්‍ර පරීක්ෂාවකින් හඳුනාගෙන ඔවුන් වගාකල ඉඩම් ප්‍රමාණය, වගාවේ වයස හා පොහොර අවශ්‍යතාවය ලිඛිතව ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත ලබා දිය යුතු වුවද කාරක සභා 07 ක් එසේ ක්ෂේත්‍ර පරීක්ෂාවකින් තොරව 2022 යල කන්නයේ කාබනික පොහොර නිකුත් කරන ලද ගොවීන්ගේ ලැයිස්තුව හෝ කුඹුරු ඉඩම් නාමලේඛනයේ සඳහන් ගොවීන්ගේ විස්තර ගොවිජන සේවා මධ්‍යස්ථානයේ Google sheet පත්‍රයට ඇතුලත් කර තිබුණි. | යල කන්නය සඳහා ඉලක්කය නිවැරදිව මධ්‍යස්ථානවලින් ලබා දී ඇති අතර Google sheet දත්ත පද්ධතිය මගින් පොහොර නිකුත් කිරීම සටහන් කරන ලද බව හා ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදු කර නොමැති බව. | ක්ෂේත්‍ර පරීක්ෂාවකින් නිවැරදිව වී වගා කරන ගොවීන් හඳුනාගෙන දිස්ත්‍රික්කයේ පොහොර අවශ්‍යතාවය නිවැරදිව තීරණය කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ 2022 ජූලි 07 දිනැති අංක SMFI/03/D/01/06/2022 චක්‍රලේඛයේ 01 ඡේදයේ 2022 ජූලි 14 දිනැති සංශෝධනයට අනුව වියළි හා අතරමැදි කලාපයට අයත් වන බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන වල වී වගා කර ඇති කුඹුරු ඉඩම් සඳහා වගාවේ වයස දින 50 නොඉක්ම වූ ඉඩම් උපරිම හෙක්ටයාර් 02 ක් සඳහා යූරියා පොහොර කි.ග්‍රෑ.100 ක් වශයෙන්ද දින 50 ඉක්මවූ වගාවන්හි ඉඩම් උපරිම හෙක්ටයාර් 02 ක් සඳහා කි.ග්‍රෑ.50 ක් වශයෙන්ද නිකුත් කිරීමට නිර්දේශ කර තිබුණද නියැදි විගණන පරීක්ෂාවට ලක්වූ ගොවිජන සේවා කාරක සභා 03 ක දින 50 ඉක්මවූ කුඹුරු ඉඩම් හෙක්ටයාර 5,558.7 ක් සඳහා දින 50 නොඉක්මවූ කුඹුරු වශයෙන් සලකා පොහොර කි.ග්‍රෑ.277,845 ක් වැඩියෙන් නිකුත් කර තිබුණි. | කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ 2022 ජූනි 07 දිනැති අංක 02/2022 චක්‍රලේඛය අනුව වගාවේ වයස දින 60 ට අඩු ගොවීන්ගෙන් මුදල් එකතු කල බවද සංශෝධිත චක්‍රලේඛය ලැබෙන විට සියළු මුදල් එකතුකර කාරක සභා ගිණුම්වලට බැරකර තිබුණු බවද 2022 ජූනි 07 දින පොහොර බෙදා හැරීම ආරම්භ කරන විට වගාවන්හි වයස දින 50 ට අඩු බවද මධ්‍යස්ථානවලට පොහොර ලැබීම ප්‍රමාද වූ බැවින් ගොවියාට පොහොර ලැබෙන දිනය වන විට වගාවේ වයස දින 50 ඉක්මවූ බව | චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |
| (iii) | ප්‍රාදේශීය ගොවිජන සංවර්ධන නිලධාරීන් විසින් පොහොර අවශ්‍යතාවයට අදාල මුදල් ගොවීන්ගෙන් අයකර ඒ අනුව ඇනවුම පිළියෙල නොකිරීම නිසා මධ්‍යස්ථානවලට ලද මුළු තොගයම ගොවීන් විසින් මිලදී ගෙන නොතිබුණි. භෞතික පරීක්ෂාවේදී හා ලේඛන පරීක්ෂාවේදී ගොවිජන සේවා කාරක සභා 03 කට අදාලව පොහොර කි.ග්‍රෑ.48,635 ක් ඉතිරි තොග වශයෙන් ගබඩා කර තිබුණු බව නිරීක්ෂණය විය. | එක් එක් බල ප්‍රදේශයේ සත්‍ය පොහොර අවශ්‍යතාවය ඇණවුම් කර ඇති බවත් රු.10,000 ක් වැනි මිලකට පොහොර ලබාගැනීමට ගොවීන්ට හැකියාවක් නොමැතිවීම නිසාත් බල ප්‍රදේශයේ මුළු පොහොර අවශ්‍යතාවයම ඇණවුම් නොකල හොත් ඉන්පසු පොහොර හිඟයකට මුහුණදීමේ අවදානමක් ඇතිවිය හැකි බැවින් මුළු පොහොර අවශ්‍යතාවයම ඇණවුම් කල බැවින් මෙසේ පොහොර ඉතිරිවූ බව | පොහොර ඇණවුම් කිරීම හා බෙදාහැරීම විධිමත් සැලසුමකට අනුව සිදුකළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | (i) | බදුල්ල ගොවිජන සේවා දිස්ත්‍රික් කාර්යාලය විසින් ගොවිජන සේවා මධ්‍යස්ථාන කලමනාකරණ සහකාර නිලධාරීන් දෙදෙනෙකුට පිළිවෙලින් 2018 නොවැම්බර් 18 දින සහ 2023 අප්‍රේල් 21 දින නිකුත් කරන ලද චෝදනා පත්‍ර සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණ පවත්වා නොතිබුණි. | එක් නිලධාරියෙකු සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් පවත්වා ඇති අතර අනෙක් නිලධාරියා විසින් අභියාචනා ඉදිරිපත් කර ඇති බව. | විධිමත් විනය පරීක්ෂණ කඩිනමින් පවත්වා එම කටයුතු අවසන් කල යුතුය. |
| | (ii) | බදුල්ල ගොවිජන සේවා දිස්ත්‍රික් කාර්යාලය විසින් ගොවිජන සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකු, කම්කරු ලිපිකරු සහ මධ්‍යස්ථාන කලමනාකරණ සහකාර නිලධාරිනියක් සම්බන්ධයෙන් විනය නියෝගයන් නිකුත් කර වසර 03 ත් 06 ත් අතර කාලයක් ගත වී තිබුණද එම නියෝගයන් ක්‍රියාත්මක කර නොතිබුණි. | එක් ගොවිජන සංවර්ධන නිලධාරියෙකු සම්බන්ධයෙන් නීතිමය කටයුතු සඳහා ප්‍රධාන කාර්යාලයෙන් උපදෙස් ඉල්ලා ඇති අතර අනෙක් ගොවිජන සංවර්ධන නිලධාරියා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කර ඇති බව, කම්කරු ලිපිකරුගෙන් අයවිය යුතු මුදල් විශ්‍රාම පාරිතෝෂිකයෙන් හා විශ්‍රාම වැටුපෙන් අය කරන බව සහ මධ්‍යස්ථාන ලිපිකරු රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කර ඇති බව. | විනය නියෝගයන් අප්‍රමාදව ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | කාරක සභා 14 ක කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් 74 දෙනෙකු වෙත විකුණා මුදල් ගෙවීමේ පදනම මත සමාලෝචිත වර්ෂය තුල සහ ඊට පෙර වර්ෂයන්හිදී නිකුත් කර තිබුණු ද්‍රව්‍ය/උපකරණ වෙනුවෙන් අයවිය යුතු රු.3,521,873 ක් අයකර ගෙන නොතිබුණි. | ඉදිරියේදී අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව | අදාල මුදල් නොපමාව අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ii) | එක් කාරක සභාවක් විසින් වටිනාකම රු.4,196,740 ක ගිවිසුම්ගත මුදලකට 2021 වර්ෂයේදී වැඩ ආරම්භ කරන ලද පොහොර ගබඩාවේ ඉදිකිරීම් වෙනුවෙන් විගණිත දින වූ | ප්‍රතිපාදන ලැබී නොමැති බැවින් වැඩ අවසන් කිරීමට නොහැකි වූ බව | ගිවිසුම් ප්‍රකාරව ගොඩනැගිල්ල ඉදිකිරීමට අවශ්‍ය කටයුතු කළයුතුය. |

2023 මාර්තු 21 දින වන විට රු.701,823 ක් ගෙවීම් කර අතරමග නවතා දමා තිබුණි.

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාරක සභා 07 ක් සතු ස්ථාවර වත්කම් 13 ක් වර්ෂ 03 ත් 15 ත් අතර කාලපරිච්ඡේදයක සිට භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | ඉදිරියේදී ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරන බව. | වත්කම් ප්‍රශස්ථ ලෙස උපයෝජනය කර ගැනීමට කටයුතු කල යුතුය. |

**3.4 මානව සම්පත් කලමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා දිස්ත්‍රික් කාර්යාලය සහ ගොවිජන සේවා කාරක සභාවලට අදාල තනතුරු 10 ක සේවකයින් 223 ක ඌණතාවයක් පැවතිණි. | ඌණ සේවකයින් සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලය දැනුවත් කර ඇති බව. | පුරප්පාඩු සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. |

**4. ගොවිජන බැංකු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2002 වර්ෂයේ සිට කාරක සභා 27 ක් විසින් ගොවීන් 4,556 කට නිකුත් කරන ලද කෘෂි ණය මුදලින් රු.77,290,093 ක් , කාරක සභා 24 ක් විසින් ගොවීන් 739 කට නිකුත් කරන ලද ව්‍යාපෘති ණය මුදලින් රු.24,845,117 ක් , කාරක සභා 17 ක් විසින් ගොවීන් 413 කට නිකුත් කරන ලද ව්‍යවසායක ණය මුදලින් රු.11,770,338 ක් හා කාරක සභා 11 ක් විසින් ගොවීන් 110 කට නිකුත් කරන ලද කෘෂි උපකරණ සහ වෙනත් ණය මුදලින් රු.2,332,642 ක් ලෙස එකතුව රු.116,238,190 ක් අයකර ගෙන නොතිබුණි. | අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම, ගොවිජන විනිශ්චය සභාව වෙත යොමු කිරීම, කාර්යාල පරීක්ෂණ පැවැත්වීම සහ දැනුවත් කිරීම් ලිපි යොමු කිරීම මගින් අයකර ගැනීමට කටයුතු කරන බව. | අදාල ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර ණය මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |